# 2022 අප්‍රේල් මස 26 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.04.26 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 09.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 21. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 01. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 මාර්තු මස 15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවෙහි 09 වන පිටුවේ අනු අංක 10 යටතේ ගිරාවුල්ල කොට්ඨාශය යන්න ගල්පාය කොට්ඨාශය ලෙස සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එන්.එම්. නන්දාවතී නවරත්න මහත්මිය

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 06හි ඡන්ද විමසීමේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී " ආර්.පී.ජී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය " ගේ නම විපක්ෂව ඡන්දය ගණනය කරන ස්ථානයෙහි සඳහන් කළ යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 22 වන පිටුවෙහි මාගේ ප්‍රකාශයේ " යම් යම් දේශපාලන පක්ෂ නියෝජිතයින් නිවාස ඉදි කළා " යන්න " යම් යම් දේශපාලන මැදිහත්වීමෙන් නිවාස ඉදි කළා " ලෙසත් " අප සභාවට අයත් ඉඩම් වලට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් ඔප්පු දුන්නා " යන්න " අප සභාවට අයත් ඉඩම් වලට කෑගල්ල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ඔප්පු දුන්නා " ලෙසත් සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, 12 වන පිටුවෙහි " මලංගමුව පාලම අසළ සිට උපතිස්ස මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම " යන්න " මලංගමුව පාලම අසළ සිට උපතිස්ස මහතාගේ නිවස අසළින් යන මාර්ගය සංවර්ධනය කිරීම " ලෙස සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.03.15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.03.15 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඈත

01. 2022 ජනවාරි මාසයට අදාළ මහා සභා රැස්වීම් වාර්තාවෙහි නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

02. 2022 පෙබරවාරි මාසයට අදාළ මහා සභා රැස්වීම් වාර්තාවෙහි නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

03. 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින් සෑම වර්ෂයකම මාර්තු 31 වන දිනට අදාළ ස්වකීය වත්කම් බැරකම් එම වර්ෂයේ ජූනි මස 30 වන දිනට පෙර ඉදිරිපත් කළ යුතුව ඇති බව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති විසින් දන්වා ඇති අතර ඒ අනුව අදාළ වත්කම් බැරකම් ප්‍රකාශ 2022.06.30 වන දිනට පෙර පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරමි.

04. 2023 වර්ෂයේ අයවැය ලේඛනය සකස් කිරීමට අදාළ පහත සඳහන් කාල සටහන සභාගත කරමි.

| අංකය | කාර්යය | ඉලක්ක දිනයන් | වගකීම |
|---|---|---|---|
| 01 | අයවැය ලේඛනය සැකසීම පිළිබඳව උපදෙස් පිළියෙල කර නිකුත් කිරීම | අප්‍රේල් 15 | නාගරික කොමසාරිස්/ලේකම් |
| 02 | කොට්ඨාශ කමිටුවට යෝජනා ඉදිරිපත් කිරීම | ජූනි 30 | කොට්ඨාශ කමිටු |
| 03 | ආදායම් හා වියදම් පිළිබඳව ඒ ඒ අංශවල වාර්තා ඉදිරිපත් කිරීම | ජූනි 30 | අංශ ප්‍රධානීන් |
| 04 | මූලික ඇස්තමේන්තු පිළියෙල කිරීම | ජූලි 15 | ගණකාධිකාරීන්/පොත් තබන නිලධාරීන්/අයවැය නිලධාරීන් |
| 05 | ස්ථාවර කමිටුවල උපදෙස් උපදෙස් ලබාගැනීම | ජූලි 31 | නාගරික කොමසාරිස්/ලේකම් |
| 06 | නගරාධිපති/සභාපතිගේ සමාලෝචනය | අගෝ:15 | නගරාධිපති/සභාපති |
| 07 | අයවැය ප්‍රතිපත්ති, තීරණය කිරීම හා සභාවට ඉදිරිපත් කිරීම | අගෝ:31 | නගරාධිපති/සභාපති |
| 08 | ආංශික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම | සැප්:30 | අංශ ප්‍රධානි |
| 09 | අවසාන අයවැය ඇස්තමේන්තු සැකසීම හා අය වැය ලේඛනය කෙටුම්පත් කිරීම | ඔක්:31 | ගණකාධිකාරීන්/පොත් තබන නිලධාරීන්/අයවැය නිලධාරීන් |
| 10 | මුදල් ස්ථාවර කමිටුව විසින් කෙටුම්පත් අයවැය ලේඛනය සලකා බැලීම | නොවැ:15 | නාගරික කොමසාරිස්/ලේකම් |

| | | | |
|---|---|---|---|
| 11 | අය වැය පණිවිඩය සැකසීම | නොවැ:20 | නගරාධිපති/සභාපති |
| 12 | කෙටුම්පත් අය වැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීම | නොවැ:30 | නගරාධිපති/සභාපති |
| 13 | අවශ්‍ය වේනම් සංශෝධිත අය වැය ලේඛනය දෙවන වර සභාවට ඉදිරිපත් කිරීම | දෙසැ:15 | නගරාධිපති/සභාපති |
| 14 | කෙටුම්පත් අයවැය ලේඛනය අනුමත කිරීම | දෙසැ:15 | මහා සභාව |
| 15 | අයවැය ලේඛනය මුද්‍රණය කර බෙදා හැරීම | දෙසැ:31 | නාගරික කොමසාරිස්/ලේකම් |

## 03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

### 05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන කාන්තා අභිවෘද්ධි වැඩ සටහන යටතේ පවත්වනු ලබන මැහුම් පාඨමාලාවේ උපදේශිකාව වෙත එක් පාඨමාලාවක් සඳහා දැනට ගෙවනු ලබන්නේ රු: 8000.00ක මුදලකි. එක් මසකට අප බල ප්‍රදේශයේ පාඨමාලා දෙකක් පවත්වන අතර එම පාඨමාලා ඉතා දුෂ්කර ප්‍රදේශ වල පවත්වන අතර ඒ සඳහා ගමන් කිරීමේදී විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එක් පාඨමාලාවක් සඳහා මාසික දීමනාව වැඩිකර දෙන ලෙස එම උපදේශිකාව විසින් ඉල්ලීම් කර ඇත. 2021.04.27 වන දින පැවති මහා සභාවේදී තීරණ අංක 05:01:02 යටතේ ගනු ලැබූ තීරණය අනුව එක් පාඨමාලාවකට රු:10,000.00ක් ලබා දීම සුදුසු බවට තීරණය කර ඇත. එහෙත් වත්මන් ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගෙන එක් පාඨමාලාවක් සඳහා එම උපදේශිකාවගේ මාසික දීමනාව රු: 15,000.00ක් ලෙස වැඩි කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව මැහුම් පාඨමාලාවේ උපදේශිකාවගේ එක් පාඨමාලාවකට අදාළ දීමනාව රු: 15,000.00ක් දක්වා වැඩි කිරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන කාන්තා අභිවෘද්ධි වැඩ සටහන යටතේ පවත්වනු ලබන මැහුම් පාඨමාලාවේ උපදේශිකාව වෙත එක් පාඨමාලාවක් සඳහා දැනට ගෙවනු ලබන්නේ රු: 8000.00ක මුදලකි. එක් මසකට අප බල ප්‍රදේශයේ පාඨමාලා දෙකක් පවත්වන අතර එම පාඨමාලා ඉතා දුෂ්කර ප්‍රදේශ වල පවත්වන අතර ඒ සඳහා ගමන් කිරීමේදී විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් එක් පාඨමාලාවක් සඳහා මාසික දීමනාව වැඩිකර දෙන ලෙස එම උපදේශිකාව විසින් ඉල්ලීම් කර ඇත. මෙම ප්‍රදේශයේ පවතින දුෂ්කරතාවය සැළකිල්ලට ගෙන 2021.04.27 වන දින පැවති මහා සභාවේදී තීරණ අංක 05:01:02 යටතේ ගනු ලැබූ තීරණය අනුව එක් පාඨමාලාවකට රු:10,000.00ක් ලබා දීම සුදුසු බවට තීරණය කළා. එම තීරණයට අනුව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමටද ඉදිරිපත් කළා. එහෙත් වත්මන් ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගෙන එක් පාඨමාලාවක් සඳහා එම උපදේශිකාවගේ මාසික දීමනාව රු: 15,000.00ක්

ලෙස වැඩි කර දෙන ලෙස එම උපදේශිකාව විසින් ඉල්ලීම් කරනවා. මෙම පාඨමාලාව තුළින් අප බල ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල් සඳහා විශාල පිටුවහලක් ලැබී තිබෙන බව ඉතාම වගකීමෙන් යුතුව මා ප්‍රකාශ කරනවා. මෙම පාඨමාලාව නැවතුණහොත් එය අප බල ප්‍රදේශයේ ජනතාවට සිදුවන ලොකු පාඩුවක්. එම නිසා මෙම උපදේශිකාවගේ මාසික දීමනාව එක් පාඨමාලාවක් සඳහා රුː 15,000.00 බැගින් ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. ඒ පිළිබඳව ගරු මහා සභාවේ ඒකඟතාවය ලබා දෙන ලෙස මා යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, අද වන විට රට තුළ පවතින ආර්ථික තත්ත්වය සැළකිල්ලට ගෙන මෙම උපදේශිකාවගේ දීමනාව වැඩි කිරීම සුදුසු බව මා අදහස් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ. විමලසේන පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, සභාවට ගමට යෑමට තිබෙන එක් අවස්ථාවක් සේම ස්වයං රැකියාව ගම තුළ ව්‍යාප්ත කිරීමට හැකියාවක් ලැබෙන ඉතාම වටිනා ව්‍යාපෘතියක් ලෙස මෙම මැහුම් පාඨමාලාව හඳුන්වා දිය හැකියි. අප ප්‍රදේශයේ මැහුම් පාඨමාලාවට සහභාගීවන ශිෂ්‍යාවන් ඉතා වටිනා නිර්මාණ රාශියක් ඉගෙනගෙන තිබෙන බව අපි දැක්කා. මෙම උපදේශිකාව ඉතා දක්ෂ ලෙස එතුමියගේ රාජකාරිය ඉතාම වගකීමෙන් යුතුව ඉටු කර තිබීම එයට හේතුවයි.ගඟ ඉහළ කෝරළේ ජීවත්වන වනිතාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට උපදේශිකාව ලබා දෙන දායකත්වය මෙම කැපකිරීම සැළකීමේදී මාසික දීමනාව රුː 15,000.00ක් ලෙස වැඩිකර ලබාදීම සුදුසු බව මාගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, වර්තමාන ඉන්ධන මිළ වැනි ආර්ථික ගැටළු පිළිබඳව සැළකීමේදී මැහුම් පාඨමාලා උපදේශිකාවගේ මාසික දීමනාව රුː 15,000.00ක් දක්වා වැඩි කිරීම සම්බන්ධයෙන් ඒකඟතාවය ඒ සඳහා ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, වර්තමානයේ පවතින ජීවන වියදම සැළකීමේදී මෙම උපදේශිකාවට ගැටළු ඇති බව පැහැදිලිය. මීට පෙර ඇයට ගෙවන ලද්දේ එක් පාඨමාලාවකට රුː 8,000.00 කි. පසු ගිය සභා වාරයේ එය රුː 10,000.00ක් ලෙසත් අද වන විට එම නිලධාරිණිය රුː 15,000.00 දක්වා එම දීමනාව වැඩි කර දෙන ලෙස ඉල්ලීම් කරනවා. එය එකටඑක වැඩි වීමක්. ඒ නිසා සේවය අගය කිරීම වෙනම දෙයක්. ඊ නැණ පියස උපදේශිකාවට අඩු මුදලක් ලබා දෙන්නේ. මගේ අදහස නම් මැහුම් පාඨමාලා උපදේශිකාවට රුː 12,000.00ක් ලබා දීම සුදුසු බව මාගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි, මෙම ඉල්ලීම කාලෝචිතයි. මෙම පාඨමාලාවේ වැදගත්කම අපි දන්නවා. ආපේ ගමට ඇයගෙන් සිදුවන සේවාව අපි දන්නවා. බොහෝ කාන්තාවන් මෙම පාඨමාලාවෙන් උගත් දේ ජීවනෝපාය කරගෙන සිටිනවා. මාගේ අදහස මැහුම් පාඨමාලා උපදේශිකාවගේ එක් පාඨමාලාවක් සඳහා මාසික දීමනාව රුː 15,000.00ක් දක්වා වැඩි කිරීම සුදුසු බවයි.

ගරු සභාපතිතුමා

ගරු මහා සභාවේ ඒකඟතාවය නම් මැහුම් පාඨමාලා උපදේශිකාවගේ එක් පාඨමාලාවක් සඳහා මාසික දීමනාව රුː 12,500.00ක් බැගින් පාඨමාලා දෙක සඳහා රුː 25,000.00 දක්වා දීමනාව වැඩි කිරීම සුදුසු බවයි. මෙම යෝජනාව සම්බන්ධයෙන් වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව වර්තමාන ආර්ථික ගැටළු සැළකිල්ලට ගෙන මැහුම් පාඨමාලාවේ උපදේශිකාවගේ එක් පාඨමාලාවකට අදාළ මාසික දීමනාව රු: 12,500.00ක් බැගින් පාඨමාලා දෙක සඳහා රු: 25,000.00 දක්වා දීමනාව වැඩි කිරීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදි.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021.10.12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශ කර 2021.10.18 වන දින පැවති මහා සභාවේ අනුමත කරන ලද කාරක සභා වාර්තාවට අනුව අප සභාවට අයත් මාර්ග 9 ක් මිනුම් කර පිඹුරුපත් සකස් කර අවසන් කර ඇත. ඒ අනුව අප සභාවට අයත් පහත නම් සඳහන් මාර්ග 9 මිනුම් කර පිඹුරුපත් සකස් කර අවසන් කර ඇති බැවින් එම මාර්ග විධිමත් පරිදි ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

අදාල මාර්ග සම්බන්ධ විස්තරය පහත පරිදි වේ.

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මී/මී) | පළල (අඩි) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|
| 01 | රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර | 01Km | 12 | 3418 |
| 02 | ඇත්ගාල ප්‍රධාන පාර | 02km | 14 | 3417 |
| 03 | සිංහපුරගම මැද පාර | 750m | 10 | 3419 |
| 04 | වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර | 3.5km | 10 | 3421 |
| 05 | යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර | 750m | 10 | 3420 |
| 06 | පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර | 2km | 10 | 3413 |
| 07 | කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර | 1.7km | 10 | 3416 |
| 08 | මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය | 1.5km | 10 | 3415 |
| 09 | අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර | 1km | 10 | 3414 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

අප සභාවට අයත් ඉහත නම් සඳහන් මාර්ග 9 මිනුම් කර පිඹුරුපත් සකස් කර අවසන් කර ඇති බැවින් එම මාර්ග විධිමත් පරිදි ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට ගරු මහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බව සහ වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බවත් පෙනී යනවා.

තීරණයः-

ඒ අනුව  අප සභාවට අයත් ඉහත නම් සඳහන් මාර්ග 9 මිනුම් කර පිඹුරුපත් සකස් කර අවසන් කර ඇති බැවින් එම මාර්ග විධිමත් පරිදි ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගැල්වනයිස් බට අස්ථානගත වීම මත සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණයේ අවසන් වාර්තාව අනුව රු.231,117.56 ක මුදල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතාගෙන් කඩිනමින් අය කර ගන්නා ලෙස විගණනයෙන් පෙන්වා දී ඇති අතර එම මුදල ආර්.පී. ගුණරත්න මහතාගෙන් කඩිනමින් අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගැල්වනයිස් බට අස්ථානගත වීම මත සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණයේ අවසන් වාර්තාව අනුව රු.231,117.56 ක මුදල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතාගෙන් කඩිනමින් අය කර ගන්නා ලෙස විගණනයෙන් පෙන්වා දී ඇති අතර එම මුදල ආර්.පී. ගුණරත්න මහතාගෙන් කඩිනමින් අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න  මහතා

ගරු සභාපතිතුමනි, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගැල්වනයිස් බට අස්ථානගත  වීම මත සිදු කරනු ලද මු.රෙ.104(4) පරීක්ෂණයේ අවසන් වාර්තාව අනුව රු.231,117.56 ක මුදල මට ගෙවන්න සිදුවෙලා තියෙනවා. මා ප්‍රාදේශීය සභාවේ සභාපතිව සිටියදී අප සභාවටත් ගැල්වනයිස් බට 167 ක ප්‍රමාණයක් ලැබුණා. එම බට සභාවට ගෙනවිත් භාර දුන්නේ රාත්‍රියේ. මෙම බට වල වගකීම එවකට සභාවේ සිටි ලේකම්තුමියට සහ විෂයභාර නිලධාරීට පැවරෙනවා. එහෙත් මාගේ දේශපාලන නායකයාගේ දැනුවත් කිරීම මත මා මෙම බට වගකීමෙන් භාර ගත්තා. එදා එම වගකීම භාර ගත්ත නිසා තමයි අද මට මෙම අලාභය ගෙවන්න සිද්ධ වෙලා තියෙන්නේ. අදත් සමහර මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල බට තිබෙනවා. මෙය

මා වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනවා. මම මගේ දේශපාලන නායකයා පාවා දුන්නේ නෑ. මම මගේ වගකීම ඉෂ්ඨ කළා. සියලු නිලධාරීන් පාවා දුන්නේ නෑ. මම FCID ගියා කිහිප වතාවක්. එහිදීත් එම නිලධාරීන් මා හට කීවේ මෙම වගකීම ඇයි මම තනිවම භාර ගන්නේ කියලා. එහෙත් මම කිසිවෙකු පාවා දුන්නේ නෑ. එහෙත් දූෂිත පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ ළඟ එම බට තිබීම පිළිබඳව ඉතාමත්ම කණගාටු වෙනවා. හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල පුෂ්පකුමාර මහතාගේ නිවසෙත් මෙම බට තිබෙන බව මා වගකීමෙන් ප්‍රකාශ කරනවා. කෙසේ වෙතත් මම මෙම අලාභ මුදල හැකි ඉක්මනින් ගෙවීමට කටයුතු කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය</u>

ගරු සභාපතිතුමනි, අද ඉදිරිපත් කර ඇති මෙම යෝජනාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා විසින් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල පුෂ්පකුමාර වන මාගේ සැමියාට මෙම චෝදනාව එල්ල කරන බව දන්නවා. එම නිසා සභාවට බට භාරදුන් බවට එවකට සභාවේ සිටි ලේකම්තුමිය විසින් ලබා දුන් ලිපිය මා සභාවට ඉදිරිපත් කරනවා. එසේම අපගේ නිවසේ එම බට නොමැති බව මා විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නාලක වසන්ත අබේසේකර මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙම බට පිළිබඳ ගැටළුව 2015 වර්ෂයේ සිටම තිබෙන්නක්. මෙම බට පිළිබඳව සොයා බැලීම තුළින් රාජ්‍ය දේපළ වලට යම් අසාධාරණයක් වූවාදැයි සොයා ගැනීමට හැකි වුණා. හිටපු ප්‍රාදේශීය සභා සභාපති ආර්.ජී. ගුණරත්න මහතා ඉතාම සද්භාවයෙන් යුතුව මෙම බට වල වගකීම ගෙන කටයුතු කළා. සමහරු එම බට ගෙන ගොස් විවිධ කටයුතු වලට යොදාගෙන තිබෙනවා. මම සහ ගරු මනතුංග මන්ත්‍රීතුමා බට හාඩ්වෙයාර් එකෙන් මිලදී ගෙන සභාවට භාර දුන්නා. එහි වගකීම තනිව භාරගෙන කටයුතු කළ මෙම අලාභය හිටපු ප්‍රාදේශීය සභා සභාපති ආර්.ජී. ගුණරත්න මහතාට ගෙවීමට සිදු වීම පිළිබඳව අපි සාකච්ඡා කරමු.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු නාලක මන්ත්‍රීතුමා පවසන ආකාරයට මෙම කාරණය සම්බන්ධව සාකච්ඡා කිරීම සුදුසුයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණය:-</u>

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගැල්වනයිස් බට අස්ථානගත වීම මත සිදු කරන ලද මු.රෙ.104(4) පරීක්ෂණයේ අවසන් වාර්තාව අනුව රු.231,117.56 ක මුදල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතාගෙන් කඩිනමින් අය කර ගැනිම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙට් හි ඉදි කර තිබූ කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබූ පහත සඳහන් නම් කරන ලද භාණ්ඩ නැවත සභාව වෙත ලබා ගෙන එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

- ලීටර් 5000 වතුර ටැංකි 01
- ෆ්ලෑෂර් ලයිට් 04

- පරිගණක මේස 02
- **Office Cupboard 02**
- **Reading Chair 04**
- **Veranda Chair 07**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙට් හි ඉදි කර තිබූ කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබූ ලීටර් 5000 වතුර ටැංකි 01, ෆ්ලෑෂර් ලයිට් 04,පරිගණක මේස 02, **Office Cupboard** 02, **Reading Chair** 04, **Veranda Chair** 07 යන භාණ්ඩ නැවත සභාව වෙත ලබා ගෙන එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, සමර්සෙට් හි ඉදි කර තිබූ කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේදී ඒ සඳහා සභාවක් වශයෙන් අපි විශාල කාර්යයක් ඉටු කළා. මෙම කොවිඩ් මධ්‍යස්ථානයේ තවමත් විශාල බඩු ප්‍රමාණයක් තිබෙනවා. අපි මේවා සභාවට ගමු. අප බල ප්‍රදේශයේ රෝහල්, සමිති ශාලාවලට මෙම භාණ්ඩ ලබා දීමට වැඩපිළිවෙලක් යොදන්න.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමා, මෙහිදී ගරු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතාගෙන් විමසන්නේ නැතුව කිසිඳු ද්‍රව්‍යයක් කිසිවෙකුට ලබා නොදෙන ලෙස උපදෙස් ලබා දුන්නා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, කොවිඩ් අවසන් වුවාට තව ඉදිරියේදි මොන මොන වසංගත එයිද කියන්න බෑ. මෙම ආයතනය ගලවා ඉවත් කරනවාට වඩා මෙයින් ප්‍රයෝජනයක් ගැනීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමනි, මෙම මධ්‍යස්ථානය සෑදීමට විවිධ පිරිස් ආධාර උපකාර ලබා දුන්නා. මෙහි විශාල බඩු ප්‍රමාණයක් තිබුණා. ඒවා නාවලපිටිය රෝහලට රැගෙන යන බව පැවසුවා. ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා මෙම ගොඩනැගිල්ල ගාර්මන්ට් එකකට හෝ ලබා දීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණයඃ-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙට් හි ඉදි කර තිබු කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානය සඳහා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබු ලීටර් 5000 වතුර ටැංකි 01, ෆ්ලෑෂර් ලයිට් 04, පරිගණක මේස 02, **Office Cupboard 02, Reading Chair 04, Veranda Chair 07** යන භාණ්ඩ නැවත සභාව වෙත ලබා ගෙන එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත කිරිම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රුඃ 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ගෙවීම් සිදු කරන ලද සමිතිය/ ආයතනය | මුදල |
|---|---|---|---|
| 01 | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපාතියේ තෙවන බිල්පත ගෙවීම | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්, අංක 119, මල්වත්ත පාර, උලපනේ | **2,936,760.42** |
| 02 | සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරස්ථානයට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය | **1,000,000.00** |
| 03 | සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල නැගෙනහිර සමිති ශාලාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය | **699,492.52** |
| 04 | සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද තැඹිලිගල දේවාලය අසල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම | උඩගම පරාක්‍රම ගොවි සංවිධානය | **664,675.67** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. පී. ගුණරත්න මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණි ඇල්ල සංචාරක ව්‍යාපාතියේ තෙවන බිල්පත ගෙවීමට අදාළව මල්වත්ත කන්ස්ට්‍රක්ෂන්, අංක 119, මල්වත්ත පාර, උලපනේ වෙත ගෙවීම් කරන ලද රුඃ **2,936,760.42** ක මුදල සඳහාත් සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරස්ථානයට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීමට අදාළව ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය වෙත ගෙවීම් කරන ලද රුඃ **1,000,000.00** ක මුදල සඳහාත් සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල නැගෙනහිර සමිති ශාලාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීමට අදාළව ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම් කරන ලද රුඃ **699,492.52** ක මුදල සඳහාත් සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද තැඹිලිගල දේවාලය අසල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීමට අදාළව උඩගම පරාක්‍රම ගොවි සංවිධානය වෙත ගෙවීම් කරන ලද රුඃ **664,675.67** ක මුදල සඳහාත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පුරාණ විහාරස්ථානයට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීමට අදාළව ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලය වෙත ගෙවීම් කරන ලද -

රුः**1,000,000.00** ක මුදල ගෙවීමට අනුමැතිය ඉල්ලා තිබෙනවා. එහෙත් මුදල් කමිටුවේ ගෙවීම් වාර්තාව යටතේ ගෙවූ මෙම මුදලට වඩා අඩුවෙන් සඳහන් වෙනවා. මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කරනවා නම් සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ජී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, මෙම ව්‍යාපෘතියට අදාළව අපි මුළු මුදලටම අනුමැතිය ගන්නවා. ගෙවන මුදල සහ හරස් සටහනෙන් සභාව රඳවා ගන්නා මුදල් ගෙවීම් වාර්තාවේ සඳහන් වෙනවා. මෙම යෝජනාව වැරදි නෑ.

ගරු සභාපතිතුමා

ගරු ආනන්ද කුලතිලක මන්ත්‍රීතුමා, මෙම ව්‍යාපෘතියට අදාළ මුළු මුදලින් 10% අතරුදවුම් මුදලත්, පෙරසැරි ගාස්තු ,මුද්දර ගාස්තු අඩුකර ඉතිරි මුදල ගෙවා තිබෙනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණයः-

ඒ අනුව මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රුः 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති ඉහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව (**Bore Hole Test**) ලබාගැනීම සඳහා ආයතන තුනකින් 2022 පෙබරවාරි මස 18 වන දින මිල ගණන් කැඳවන ලදි. එහිදී මිල ගණන් ඉදිරිපත් කරන ලද්දේ එක් ආයතනයකින් පමණක් වන අතර සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය(**Soil Tech (Pvt) Ltd**) මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක(585,000.00)මිල ගණනක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව අදාළ ආයතනය මගින් පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව (**Bore Hole Test**) ලබාගැනීම සඳහා ආයතන තුනකින් මිළ ගණන් කැඳවූවා. එහිදී එකම මිළ ගණනක් ඉදිරිපත් කරන ලද සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය(**Soil Tech (Pvt) Ltd**) මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක (රුः 585,000.00) වටිනාකමකින් යුත් මිළ ගණනක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අදාළ ආයතනය මගින් පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වීමේදී එම භූමියේ පාංශු පරීක්ෂණයක් සිදු කළ යුතුයි. කුරුඳුවත්ත නව වෙළඳ සංකීර්ණය ඉදි කරන භූමියේද එම භූමි පරීක්ෂණය සිදු කිරීම අවශ්‍යයි. එම වාර්තාව අනුව තමයි ගොඩනැගිල්ලෙහි කොතරම් අත්තිවාරමක් යෙදිය යුතුද යන්න තීරණය කළ යුත්තේ. එය තාක්‍ෂණ උපදෙස් අනුව කටයුතු කළ යුතුයි. මෙය ස්ථිර සාර ගොඩනැගිල්ලක්. නිවැරදිව අත්තිවාරම යොදා ගැනීමට පාංශු පරීක්ෂණය සිදු කිරීම අවශ්‍යයි. එම නිසා එකම මිළ ගණනක් ඉදිරිපත් කරන ලද සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය **(Soil Tech (Pvt) Ltd)** මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක (රුඃ 585,000.00) වටිනාකමකින් යුත් මිලකට සිදු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණයඃ-

ඒ අනුව කුරුදුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - අදියර 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පාංශු තත්ත්ව පරීක්ෂණ වාර්තාව **(Bore Hole Test)** ලබාගැනිම සඳහා එකම මිළ ගණනක් ඉදිරිපත් කරන ලද සොයිල් ටෙක් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය**(Soil Tech (Pvt) Ltd)** මගින් රුපියල් පන්ලක්ෂ අසූපන්දහසක (රුඃ 585,000.00) වටිනාකමකින් යුත් මිළට සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

උලපනාවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 පළාත් නිශ්චිත ප්‍රජා ජල සංවර්ධන වැඩසටහන මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව අදාළ ව්‍යාපෘතිය ආශ්‍රිතව ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය මගින් දුරකථන කුළුණක් සවි කිරීමේදි ව්‍යාපෘතියේ ජලනල කැගොස් ඇත. එහිදි අදාළ පාර්ශව අතර සාකච්ඡාවෙන් පසුව ව්‍යාපෘතිය සඳහා සිදුවූ පාඩුව ලංකා විදුලි බල මණ්ඩලය විසින් අප ආයතන වෙත ගෙවීම් කිරීමට එකඟ වූ අතර ඒ අනුව තාක්ෂණ නිලධාරී මහතාගේ වාර්තාව අනුව අදාළ මුදල වන රුපියල් හයලක්ෂ විසිහතර දහස් නවසිය හැත්තෑපහක මුදල අප ආයතනය වෙත ලබාදි ඇත. ඒ අනුව අදාළ මුදලින් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සිදු කර යථා තත්ත්වයට පත් කිරීම සඳහා යෙදවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා

මෙම යෝජනාව සංශෝධනය කර පහත සඳහන් යෝජනාව ඒ සඳහා ඉදිරිපත් කරනවා.

සංශෝධිත යෝජනාවඃ-

උලපනාවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 පළාත් නිශ්චිත ප්‍රජා ජල සංවර්ධන වැඩසටහන මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව අදාළ ව්‍යාපෘතිය ආශ්‍රිතව ලංකා විදුලි බල මණ්ඩලය මගින් අධිබලැති විදුලි රැහැන් සහිත කුළුණක් සවි කිරීමේදි ව්‍යාපෘතියේ ජලනල කැඩී ගොස් ඇත. එහිදි අදාළ පාර්ශව අතර සාකච්ඡාවෙන් පසුව ව්‍යාපෘතිය සඳහා සිදුවූ පාඩුව ලංකා විදුලි බල මණ්ඩලය විසින් අප ආයතන වෙත ගෙවීම් කිරීමට එකඟ වූ අතර ඒ අනුව තාක්ෂණ නිලධාරී මහතාගේ වාර්තාව අනුව අදාළ මුදල වන රුපියල් හයලක්ෂ විසිහතර දහස් නවසිය හැත්තෑපහක මුදල අප ආයතනය වෙත ලබාදි ඇත. ඒ අනුව අදාළ මුදලින් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සිදු කර යථා තත්ත්වයට පත් කිරීම සඳහා යෙදවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී.ඩබ්.පී.පී. ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උලපනාවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 පළාත් නිශ්චිත ප්‍රජා ජල සංවර්ධන වැඩසටහන මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන අතර එම ව්‍යාපෘතිය ආශ්‍රිතව ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය මගින් අධිබලැති විදුලි රැහැන් සහිත කුළුණක් සවි කිරීමේදි ව්‍යාපෘතියේ ජලනල කැඩී ගොස් ඇත. එම ජල ව්‍යාපෘතියේ හානි සිදු වූ ජලනල යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය මගින් අප සභාවේ තාක්‍ෂණ නිලධාරි වාර්තාවට අනුව රුः 624,975.00 ක මුදල අප වෙත ලබාදී තිබෙනවා. ඒ අනුව එම මුදල ජල ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණයः-

ඒ අනුව උලපනාවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 පළාත් නිශ්චිත ප්‍රජා ජල සංවර්ධන වැඩසටහන මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක අතර එම ව්‍යාපෘතිය ආශ්‍රිතව ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය මගින් අධිබලැති විදුලි රැහැන් සහිත කුළුණක් සවි කිරීමේදි හානි සිදු වූ ජලනල යථා තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය මගින් අප සභාවේ තාක්‍ෂණ නිලධාරි වාර්තාවට අනුව රුः 624,975.00 ක මුදල අප වෙත ලබාදී තිබෙනවා. ඒ අනුව එම මුදල ජල ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:08 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂ වලට අදාළව සභා අරමුදල් ගරු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කර්මාන්ත ණය හිමි කළද මේ වන තෙක් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති වලට අදාළ ප්‍රතිපාදන නැවත සභා අරමුදලට ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ. විමලසේන පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂ වලට අදාළව සභා අරමුදල් ගරු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කර්මාන්ත ණය හිමි කළද, මේ වන තෙක් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති වලට අදාළ ප්‍රතිපාදන නැවත සභා අරමුදලට ගැනීමට සිදු වෙනවා. මෙම ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කිරීමට නොහැකි හෙයින් එම ප්‍රතිපාදන නැවත සභා අරමුදලට ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි, 2021 වර්ෂයේ මා විසින් ලබා දුන් රු:300,000.00 ක් වටිනා පුස්තකාලයේ ඉදිරිපස බැම්ම ඉදිකිරීම ව්‍යාපෘති යෝජනාව පවතින සිමෙන්ති මිළ ඉහළ යාම මත ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබෙනවා. මෙය අත්‍යවශ්‍ය කාරණයක් වන බැවින් සභාවේ සේවකයින් යොදවා හෝ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ගරු සභාපතිතුමා

එය කළ හැකිදැයි සොයා බැලිය යුතුයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂ වලට අදාළව සභා අරමුදල් ගරු මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ කර්මාන්ත ණය හිමි කළද මේ වන තෙක් ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති වලට අදාළ ප්‍රතිපාදන නැවත සභා අරමුදලට ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:09 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

උඩුවැල්ල ගම්මානයේ සහ තාමරවැලිවත්ත ගම අතරින් ගලා යන මා ඔය හරහා එහා මෙහා වීමට පාලමක් නොමැතිව ඉතා දුෂ්කරතාවයට පත්ව ඇති බැවින් එම පාලම සාදා ගැනීමට සහාය ලබා දෙන ලෙස ගම්වාසීන් විසින් ඉල්ලීමක් කර ඇත. ලෝකානන්ද විහාරස්ථානය අසළ යකඩ පාලම වෙනුවට දැනට නව පාලමක් ඉදි කර ඇති නිසා එහි තිබූ පරණ පාලමේ යකඩ යොදා නව පාලමක් සකස් කර ගැනීමට අවශ්‍ය යකඩ ලබා දෙන ලෙසද එම ගම්වාසීන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව මෙම ගම්වාසීන්ගේ ඉල්ලීම සළකා බලා ලෝකානන්ද විහාරස්ථානය අසළ ඇති යකඩ පාලමේ තිබූ යකඩ උඩුවැල්ල ගම්මානයේ සහ තාමරවැලිවත්ත ගම අතරින් ගලායන මා ඔය හරහා එහා මෙහා වීමට පාලමක් සාදා ගැනීමට ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ. විමලසේන පතිරණ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උඩුවැල්ල ගම්මානයේ සහ තාමරවැලිවත්ත ගම අතරින් ගලා යන මා ඔය හරහා එහා මෙහා වීමට පාලමක් නොමැතිව ඉතා දුෂ්කරතාවයට පත්ව ඇති බැවින් එම පාලම සාදා ගැනීමට සහාය ලබා දෙන ලෙස ගම්වාසීන් විසින් ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා. මෙය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාලමක්. එම ස්ථානයේ නව යකඩ පාලමක් ඉදි කර ඇති නිසා මෙහි තිබූ පැරණි යකඩ පාලමේ යකඩ උඩුවැල්ල ගම්මානයේ සහ තාමරවැලිවත්ත ගම අතරින් ගලායන මා ඔය හරහා එහා මෙහා වීමට පාලමක් සාදා ගැනීමට ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, මෙම පාලමේ ආරක්ෂිත වැට සහ යකඩ කණු දෙක ප්‍රයෝජනයකට ගත හැකියි.

ගරු සභාපතිතුමා

**මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.**

තීරණයඃ-

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා සමඟ සාකච්ඡා කර ලෝකානන්ද විහාරස්ථානය අසළ පැරණි පාලමේ යකඩ යොදා නව පාලමක් සකස් කර ගැනීමට අවශ්‍ය යකඩ උඩුවැල්ල ගම්මානයේ සහ තාමරවැලිවත්ත ගම අතරින් ගලායන මා ඔය හරහා එහා මෙහා වීමට පාලමක් සාදා ගැනීමට ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

05:01:10 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු CPLL 7322 අංක දරණ ජල බවුසරයෙන් සමර්සෙට්හි පිහිටි කොවිඩ් 19 නිරෝධායන මධ්‍යස්ථානයට 2021.11.16 වන දින සිට 2022.03.16 වන දින දක්වා ජලය ලබාදීමට අදාළව අප සභාවෙන් වැය කරන ලද රුඃ 242,652.86 ක ඉන්ධන වියදම වෙනුවෙන් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.**

ගරු සභාපතිතුමා

**මෙම යෝජනාව සංශෝධනය කර පහත සඳහන් යෝජනාව ඒ සඳහා ඉදිරිපත් කරනවා.**

සංශෝධිත යෝජනාවඃ-

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු CPLL 7322 අංක දරණ ජල බවුසරයෙන් සමර්සෙට්හි පිහිටි කොවිඩ් 19 නිරෝධායන මධ්‍යස්ථානයට 2021.06.20 වන දින සිට 2022.03.16 වන දින දක්වා ජලය ලබාදීමට අදාළව අප සභාවෙන් වැය කරන ලද රුඃ 753,605.46 ක ඉන්ධන වියදම වෙනුවෙන් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු CPLL 7322 අංක දරණ ජල බවුසරයෙන් සමර්සෙට්හි පිහිටි කොවිඩ් 19 නිරෝධායන මධ්‍යස්ථානයට 2021.06.20 වන දින සිට 2022.03.16 වන දින දක්වා ජලය ලබාදීමට අදාළව ජල බවුසරය සඳහා අප සභාවෙන් වැය කරන ඉන්ධන වියදම වන රුඃ 753,605.46 ක මුදල සභා අරමුදලින් වියදම් කිරීමට අදාළ ගරු මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, සභාවේ වාහන වලට ඉන්ධන ලබාදීමේදී ඒ පිළිබඳව ඔබතුමා විශේෂ අවධානය යොමු කරන්න. ඔබතුමාට පැවරී තිබෙන කාර්යයන් සමඟ මේවා පිළිබඳව සොයා බලන්න බැරිවෙයි. එම වාහන වල ධාවන සටහන් නිවැරදි විය යුතුයි. නිලධාරීන් විසින් මේවා නිවැරදි කිරීමට කටයුතු කරන්න. මහා සභාවට ගෙවන්න වෙයි ගැටළුවක් වුණොත්. ඒ නිසා අදාළ වගකීම් නිවැරදිව භාරගෙන මෙම කාලය තුළ නිවැරදි වැඩ පිළිවෙලක් ගෙනයාමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

සභාවේ වාහන සම්බන්ධයෙන් සොයා බලා ඒ වගකීම ගෙන කටයුතු කිරීමට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතාටත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතාටත් පවරනවා. මෙය මට කරන උදව්වක් සේ සළකලා කටයුතු කරන්න. මෙයින් කිසිවෙකු අපහසුතාවයට පත් කරන්නේ නෑ. ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. විමලසේන පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, මෙම ගෙවීමට අදාළ මුළු මුදල වන රුඃ 753,605.46 ක මුදල වැය කළ ආකාරය සම්බන්ධව අපට පැහැදිලි විස්තරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

එම ගෙවීම් විස්තරය ඊළඟ සභාවට ඉදිරිපත් කරනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, වාහන වලට ඉන්ධන වියදම් දැරීම සම්බන්ධයෙන් එක් එක් වාහනයෙන් වාහනයට මාසිකව අපට වාර්තාවක් ලබා දෙන්න. මොකද අපි අනුමත කරන වියදම් අපි දැනගැනීම අවශ්‍යයි.

ගරු සභාපතිතුමා

එම ගෙවීම් විස්තරය ඊළඟ සභාවට ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණයඃ-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු CPLL 7322 අංක දරණ ජල බවුසරයෙන් සමර්සෙට්හි පිහිටි කොවිඩ් 19 නිරෝධායන මධ්‍යස්ථානයට 2021.06.20 වන දින සිට 2022.03.16 වන දින දක්වා ජලය ලබාදීමට අදාළව අප සභාවෙන් වැය කරන ලද රුඃ 753,605.46 ක ඉන්ධන වියදම වෙනුවෙන් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසි යෝජනා - ඇත

### 06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති මූල්‍ය ප්‍රතිපත්ති ඇතුළත් වන චක්‍රලේඛයට අනුව ස්ථාවර තැම්පතු වල පොළී අනුපාතිකය ඉහළ නැංවීමත් සමඟ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 20% වන බැවින් එම බැංකු වලට අදාළ තැන්පතු නැවත අලුත් කිරීමටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 15% වන බැවින් එම තැම්පතු ඉහළ පොළී ප්‍රතිශතයක් ලබා දෙනු ලබන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ආයෝජනය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති මූල්‍ය ප්‍රතිපත්ති ඇතුළත් වන චක්‍රලේඛයට අනුව ස්ථාවර තැම්පතු වල පොළී අනුපාතිකය ඉහළ නැංවීමත් සමඟ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 20% වන බැවින් එම බැංකු වලට අදාළ තැන්පතු නැවත අලුත් කිරීමටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 15% වන බැවින් එම තැම්පතු ඉහළ පොළී ප්‍රතිශතයක් ලබා දෙනු ලබන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ආයෝජනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 20% වන බැවින් එම බැංකු වලට අදාළ තැන්පතු නැවත අලුත් කිරීමටත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජනය කර ඇති මේ වන විට කල්පිරී ඇති ස්ථාවර තැම්පතු සඳහා දැනට ගෙවනු ලබන පොළී ප්‍රතිශතය 15% වන බැවින් එම තැම්පතු ඉහළ පොළී ප්‍රතිශතයක් ලබා දෙනු ලබන ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ආයෝජනය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් වඩාත් විධිමත්ව සිදු කර ගැනීමටත් අදාළ ක්‍රියාවලීන් නීති මගින් ශක්තිමත් කර ගැනීමටත් අතුරු ව්‍යවස්ථා සැකසීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත. ඊට අදාළව අප සභාව මගින් සම්පාදනය කිරීමට යෝජිත සංචාරක ව්‍යාපෘති සඳහා අතුරු ව්‍යවස්ථාව, කායවර්ධන මධ්‍යස්ථානය පවත්වා ගැනීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය අතුරු ව්‍යවස්ථාව යටතේ පොහොර අළෙවිය සඳහා අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා සැකසීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් එම අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාළව පහත

**නම් සඳහන් නිළධාරීන්ගෙන් යුත් කමිටුව පත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.**

**අතුරු ව්‍යවස්ථා කමිටුවේ සභාපති - ගරු සභාපති ජී.ඕ.ජී.එන්.බී.ජයසේකර මහතා**

**කමිටු සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී. ප්‍රසන්න විමල් මනතුංග මහතා**

**කමිටු සාමාජික - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී. කොල්වින් සිල්වා මහතා**

**කමිටු සාමාජික - ඩී.එම්.එල්.ඩී.දසනායක මිය (ලේකම්)**

**කමිටු සාමාජික- ආර්.ඒ.එස්. පල්ලේවෙල මහතා (ප්‍රජා සංවර්ධන නිලධාරි)**

**කමිටු සාමාජික - අචලා කුරුන්දෙණිය මිය ( විමර්ශන නිලධාරි )**

**කමිටු සාමාජික - පී.ජී.එස්.ජේ. කිත්සිරි මහතා ( සංවර්ධන නිලධාරි)**

**කමිටු සාමාජික - බී.ජී.ටී. දිසානායක මහතා ( සංවර්ධන නිලධාරි)**

**කමිටු සාමාජික - ටී.සී. ප්‍රීතිකා ද සිල්වා මිය ( ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි )**

**කමිටු සාමාජික - ආර්. ආර්.ප්‍රේමවංශ මිය ( සංවර්ධන නිලධාරි)**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ. විමලසේන පතිරණ මහතා</u>

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

<u>ගරු සභාපතිතුමා</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් වඩාත් විධිමත්ව සිදු කර ගැනීමටත් අදාළ ක්‍රියාවලින් නීති මඟින් ශක්තිමත් කර ගැනීමටත් අතුරු ව්‍යවස්ථා සැකසීමේ අවශ්‍යතාවය පැනනැගී ඇත. ඊට අදාළව අප සභාව මගින් සම්පාදනය කිරීමට යෝජිත සංචාරක ව්‍යාපෘති සඳහා අතුරු ව්‍යවස්ථාව, කායවර්ධන මධ්‍යස්ථානය පවත්වා ගැනීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය අතුරු ව්‍යවස්ථාව යටතේ පොහොර අළෙවිය සඳහා අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා සැකසීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවටත් එම අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාළව ඉහත නම් සඳහන් නිළධාරීන්ගෙන් යුතු කමිටුව පත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

**වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව සහ විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.**

<u>**තීරණය:-**</u>

**ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් වඩාත් විධිමත්ව සිදු කර ගැනීමටත් අදාළ ක්‍රියාවලින් නීති මඟින් ශක්තිමත් කර ගැනීමට අදාළව අප සභාව මගින් සම්පාදනය කිරීමට යෝජිත සංචාරක ව්‍යාපෘති සඳහා අතුරු ව්‍යවස්ථාව, කායවර්ධන මධ්‍යස්ථානය පවත්වා ගැනීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය අතුරු ව්‍යවස්ථාව යටතේ පොහොර අළෙවිය සඳහා අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා සැකසීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා**

දීම සුදුසු බවටත් එම අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාළව ඉහත නම් සඳහන් නිලධාරීන්ගෙන් යුත් කමිටුව පත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07. කාරක සභා වාර්තා සළකා බැලීම

### 01.මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

2022.04.19 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 මාර්තු මස මුළු ලැබීම් රුඃ9,426,667.83 ක්ද මුළු වියදම රුඃ10,996,000.54 ක්ද විය. 2022 මාර්තු මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයද 2022.04.19 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

02. මිළ ගණන් විවෘත කිරීමේ කමිටු වාර්තාව 14 සභාගත කරන ලදි.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.04.08 සිට 2022.04.22 වනදින දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු අංකය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර අංකය | හරස් සටහන | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 2022-04-08 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ ඩෙන්මාර්ක් කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදී සිටින සෞඛ්‍ය කම්කරුවන් පස් දෙනෙකු සහ ස්ථිර සේවකයින් දෙදෙනෙකු සඳහා 2022 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ගෙවීම. | 440 | | 70,000.00 |
| 2 | | උඩගම පරාක්‍රම ගොවි සංවිධානය- උලපනේ | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද තැඹිලිගල දේවාලය අසල මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 441 | 76,662.69 | 588,012.98 |
| 3 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු ඒ.එස් ජේ. සඳරුවන් පෙරේරා මයාට 2022 වර්ෂය සඳහා උත්සව අත්තිකාරම් ගෙවීම. | 442 | | 10,000.00 |
| 4 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ කසල මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරු 05 දෙනෙකු සදහා 2022 මාර්තු මස වැටුප් ගෙවීම. | 443 | 125.00 | 145,652.91 |
| 5 | | එන්.පී.එස්.එස්.සෝමතිලක මයා - රියදුරු | 2022 - මාර්තු මස අතිකාල දීමනා ගෙවීම (පැය 150) | 444 | | 16,792.50 |
| 6 | | පී.පී.එස්.ජේ කිත්සිරි මයා - පරිසර නිලධාරි | 2022 පෙබරවාරි මස 12,19,26 සෙනසුරාදා දිනයන්හි සේවය කිරීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම. | 445 | | 6,808.50 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | | පී. කවිදර්ශනා මිය - භාෂා පරිවර්තක | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස පැවති මහ සභා වාර්තාව දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම | 446 | | 10,000.00 |
| 8 | 2022-04-09 | ABC ඔටෝ සර්විස් සෙන්ටර් , උලපනේ | CPRD-0926 ට්‍රැක්ටරයේ ඩිෆරන්ෂල් ඔයිල් අලුතින් දැමීම (ට්‍රේලරයේ ටිපර් ජැක් එක කැඩිගිය නිසා) වෙනුවෙන් මුදල් ගෙවීම. | 447 | | 18,750.00 |
| 9 | | ABC ඔටෝ සර්විස් සෙන්ටර් , උලපනේ | CPYU-8947 ත්‍රිරෝද රථයේ කි.මී.4057 සීමාවේ සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 448 | | 5,175.00 |
| 10 | | සමගි ප්‍රජා මූල සංවිධානය-කුරුදුවත්ත | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 මාර්තු මස ජල බිල ගෙවීම. | 449 | | 120.00 |
| 11 | | ගොඩකුඹුර කොමියුනිකේෂන්-කුරුදුවත්ත | කුරුදුවත්ත මහජන පුස්තකාලයේ 2022 මාර්තු මස පුවත්පත් මිලදී ගැනිම වෙනුවෙන් ගෙවිය යුතු මුදල, හිඟ කඩකුලි සඳහා හිලව් කිරිම | 450 | 4,670.00 | |
| 12 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කාර්යාල ලිපි තැපැල් කිරීම සඳහා මුද්දර ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 451 | | 8,000.00 |
| 13 | | ඒ.එස් ජේ. සඳරුවන් පෙරේරා මයා (බර වාහන ක්‍රියාකරු ) | CPZA 5189 අංක දරණ බැකෝලෝඩරයේ බූමයට සම්බන්ධවන හයිඩ්‍රොලික් හෝස් එකක් අලුතින් දැමීම වෙනුවෙන් අතින් වැය වූ මුදල ගෙවීම. | 452 | | 4,250.00 |
| 14 | 2022-04-21 | සෙන්ට්‍රල් ස්ටේෂනරීස් ,කොළඹ පාර මහනුවර | කාර්යාල ලිපි ද්‍රව්‍ය(රතු ,නිල් පෑන්, 9×4 ලිපිකවර, තීන්ත පෑඩ්, රෝස පාට A4, නිල් පාට A4, සැම්සුන් ටෝනර්, LQ 2090 රිබන්) ලබා ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 453 | 25.00 | 42,765.00 |
| 15 | | එන්.යූ.පී.ඒ.එස්.විමලරත්න මයා කුරුදුවත්ත කඩවීදිය | සමර්සෙට් කොවිඩ් රෝහලේ ගොඩනැගිල්ල තුල ඇති භාණ්ඩවල ආරක්ෂාව වෙනුවෙන් ඉබි යතුරු මිලදී ගැනිම වෙනුවෙන් මුදල් ගෙවීම. | 454 | | 2,750.00 |
| 16 | 2022-04-22 | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022/03/28 දින වවුචර් අංක 371 මගින් ඵලදායිතා තත්ත්ව කව හා එස් පහ සංකල්පය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා ලබාගත් අත්තිකාරම් පියවීම. | 455 | | 14,000.00 |
| 17 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357689 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 456 | | 11,874.31 |
| 18 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357117 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 457 | | 2,357.87 |
| 19 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357690 අංක දරණ ඊ නැණ පියස දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 458 | | 1,427.30 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 20 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357510 අංක දරණ ගරු සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 459 | | 1,492.30 |
| 21 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2352123 අංක දරණ ඇත්ගාල උප කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 460 | | 692.94 |
| 22 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357082 අංක දරණ ගරු උප සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2022 පෙබරවාරි | 461 | | 978.60 |
| 23 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357015 අංක දරණ කුරුදුවත්ත පුස්තකාලයේ රවුටරය සදහා බිල්පත ගෙවිම - 2022 පෙබරවාරි | 462 | | 1,447.15 |
| 24 | | ඒ.පී.එල්.එම්.පියනන්දන මිය- කළමනාකරණ සේවා නිලධාරි | නිවසේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය මුදල ගෙවීම. | 463 | 25.00 | 69,975.00 |
| 25 | | අම්බලපිටිය ග්‍රාම සංවර්ධන සමිතිය- අම්බලපිටිය | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කුරුදුවත්ත උද්දල්තුඩුව මාර්ගයේ සිට වටමලේපාර සංවර්ධනය කිරිම කර්මාන්තයේ රැදවුම් මුදල් ගෙවීම. | 464 | 25.00 | 44,882.69 |
| 26 | | එම්.පී.සිසිර කුමාර මයා- වැඩ මූලික | සමර්සෙට් කොවිඩ් රෝහලේ තිබු ජල ටැංකි (ප්ලාස්ටික්) 04ක් නැවත සභාව වෙත ගෙන ඒම සඳහා අතින් වියදම් වූ ලොරි කුලි මුදල ගෙවීම. | 465 | | 3,000.00 |
| 27 | | බී.පී.මිල්ටන්රත්න මයා - මාර්ග කම්කරු | 2022 - පෙබරවාරි මස අතිකාල දිමනා ගෙවීම (පැය 63 වි 18) | 466 | | 6,659.10 |
| 28 | | කේ.පි ක්‍රිශාන්ත සමන්සිරි මයා - මාර්ග කම්කරු | 2022 - පෙබරවාරි මස අතිකාල දිමනා ගෙවීම (පැය 47 වි 27) | 467 | | 4,991.65 |
| | | එකතුව | | | 81,532.69 | 1,092,855.80 |

09. වෙනත්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

**ගරු සභාපතිතුමා**

**අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභා වාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.55 ට අවසන් කරන ලදි.**

**සභාපති**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**2022.04.26 වන දින ගඟ ඉහළ කෝරළේ**

**ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදීය**